MODULE 4

# ඩිජිටල් සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීම

## ප්‍රකාශනය


පළමු ප්‍රකාශනය 2020 මාර්තු

ප්‍රකාශනය :
ශ්‍රී ලංකාජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානය**(NCEASL)**

වෙබ් අඩවියට **www.minormatters.org**

සංස්කාරකට නාලක ගුණවර්ධන

ව්‍යාපෘති සම්බන්ධීකරණය:

යමිනිරවින්ද්‍රන්,අධ්‍යක්ෂ -නීති සහ උපදේශන ෂලෝම් ඩැනියෙල්, නීති සහ උපදේශනසම්බන්ධීකාරක, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභාඅක්ෂිණපළිහවඩන, මාධ්‍ය මූලෝපාය නිලධාරී, ආගමික නිදහස සහ සමාජ සාධාරණ කොමිෂන් සභා

පිට කවර නිර්මාණය: සංජයන් අරියදුරෙ

පිටු පිරිසැලසුම සහ නිර්මාණය: ෂෙනල් ජෙසුඩියන්



Commons Attribution-ShareAlike 3.0 IGO (CC-BY-SA 3.0 IGO) license
බලපත්‍රය යටතේ මෙය භාවිතා කළ හැක.
http://creativecommons.org/licenses/by-sa/3.0/igo/

වියාචනය:

මෙම ප්‍රකාශනයේ අන්තර්ගත විශ්ලේෂණයන් අදහස් දායකයින්ගේ සහ සංස්කාරකවරුන්ගේ අදහස් වේ. ඔවුන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයේ සාමාජිකයන් නොවන අතර සංවිධානය නියෝජනය නොකරයි.

# ඩිජිටල් සුරක්ෂිතභාවය ප්‍රවර්ධනය කිරීම

කලින් ද සටහන් කරන ලද ආකාරයට, සයිබර් ආරක්ෂාව යනු පද්ධති සහ උපාංග සම්බන්ධ කාරණයකි. සයිබර් සුරක්ෂාව යනු ඒවා පාවිච්චි කරන පුද්ගලයන් සම්බන්ධ කාරණයකි.

මෙම මොඩියුලය විසින් ආවරණය කරනු ලබන්නේ ඩිජිටල් සහ සයිබර් සුරක්ෂිතභාවය පිළිබඳ මූලික කාරණා ය. එනම්, ඩිජිටල් තාක්ෂණයන් සහ වෙබ් සේවා භාවිතා කරන මිනිසුන්ගේ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ කාරණා ය.

බොහෝ අය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය අතර වෙනස නොදකිති. එහෙත්, මෙම සංකල්ප දෙක එකක් නොවේ. එම වෙනස තේරුම් ගැනීම වැදගත් ය. සිංහල භාෂාවෙහි මේ සම්බන්ධයෙන් ඇති වචන බොහෝ විට සමාන අරුත් වෙනුවෙන් භාවිතා කරනු ලැබේ.

ඩිජිටල් උපාංග, දත්ත හා ඩිජිටල් අනන්‍යතාව ආරක්ෂා කරගැනීම සඳහා පොදු ප්‍රවේශයක් තිබේ. එහෙත් එපමණක් සෑහෙන්නේ නැත. සුරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ හැකි වන්නේ මානව පරිශීලකයන්ගේ අවශ්‍යතා සහ යථාර්ථයන් ද ග්‍රහණය කරගත් විට ය.

ආරක්ෂිත වීමෙන් සුරක්ෂිතභාවය ද අදහස් විය හැකි ය. එහෙත්, ආරක්ෂිත වීමෙන් අනිවාර්යයෙන් ම පුද්ගලයකු සුරක්ෂිත වන බව අදහස් වන්නේ නැත. අප ආරක්ෂාව හා සුරක්ෂිතබව පිළිබඳ කතා කරන ආකාරය වැදගත් වන්නේ අප එමගින් යහපත් ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම පිළිබඳ සිතන බැවිනි.

යහපත් ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අප විසින් විශ්වාසය, යහපත් සම්බන්ධතා සහ සහයෝගය වැනි ගුණාංග ප්‍රවර්ධනය කළ යුතුව තිබේ. ඒ වෙනුවෙන් අපට ප්‍රගතිශීලී නීති, රෙගුලාසි මෙන් ම ඒවා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය ය.

ප්‍රධාන ප්‍රවණතා විශ්ලේෂණය කරන සහ ප්‍රතිපත්තිමය සහ නියාමනය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන පර්යේෂණ විසින් එවැනි ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය දැනුම් පදනම නිර්මාණය කරනු ලැබේ.

තාක්ෂණික කර්මාන්ත, නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන, සිවිල් සමාජ කණ්ඩායම් සහ පුද්ගල පරිශීලකයන් එක්ව වැඩ කිරීම ඔස්සේ මේ සම්බන්ධ සහයෝගිතාවන් මතු විය හැකි ය.


# ප්‍රධාන යෙදුම්

සයිබර් හිංසනය: සයිබර් හිංසනය යනු, ජංගම දුරකථන, පරිගණක සහ ටැබ් වැනි ඩිජිටල් උපාංග භාවිතා කරමින් සිදුකරන හිංසනයයි. එය කෙටි පණිවුඩ, ඇප්, සමාජ මාධ්‍ය, වෙබ් අඩවි, සංසද හෝ ක්‍රීඩා හරහා සිදු විය හැකි ය. පුද්ගලයන්ට ඒවා දකින්නට ලැබේ. සහභාගි විය හැකි ය. අන්තර්ගතයන් බෙදාගැනීම කළ හැකි ය. යම් අයෙකු පිළිබඳ හානිකර, ව්‍යාජ හෝ නිශේධාත්මක අන්තර්ගතයන් යැවීම, පළකිරීම හො බෙදාගැනීම සයිබර් හිංසනයට ඇතුළත් වේ. වෙනත් අයෙකු පිළිබඳ පෞද්ගලික හෝ පොදු තොරතුරු  එම පුද්ගලයාට කරදරයක් හෝ හිංසාවක් සිදු වන පරිදි බෙදාහදාගැනීම ද එයට ඇතුළත් විය හැකි ය. ඇතැම් සයිබර් හිංසනයන් සාපරාධී සහ නීති විරෝධී ක්‍රියාවන් බවට ද පත් වේ.

**Source: https://www.stopbullying.gov/cyberbullying/what-is-it/index.html**

ට්‍රොල් යනු, අන්තර්ජාල ප්‍රජාවේදී වැරදි කරන, කරදරකාරී සහ මතභේදාත්මක අදහස් පළකරන්නෙකි. බොහෝ විට ට්‍රොල් මගින් අතිශයෝක්ති ප්‍රකාශ සිදු කරනු ලැබේ. ඒවායේ අරමුණ වන්නේ පරිශීලකයන් ප්‍රතිචාර දැක්වීම සඳහා පොළඹවාගැනීමයි.

**Source:  https://www.techopedia.com/definition/429/troll**



## ඩිජිටල් සුරක්ෂාව සහ මානව හිමිකම්

මානව හිමිකම් මත පාදක වූ ඩිජිටල් සුරක්ෂා ප්‍රවේශයක් අපට අවශ්‍ය ය. එහිදී, සෑම කෙනෙකුට ම, සෑම තැනකදී ම ආරක්ෂිත සහ සුරක්ෂිත අන්තර්ජාල ප්‍රවේශයක් කිසිදු වෙනස්කම් කිරීමකින් හෝ හිංසනයකින් තොරව ලබාගැනීමේ අයිතිය තිබිය යුතු ය.

පළමු මොඩියුලයේ දක්වන ලද පරිදි, බාහිර භෞතික අවකාශයේදී පුද්ගලයන්ට තිබෙන සෑම මානව හිමිකමක් ම අන්තර්ජාලයේදී ද ආරක්ෂා කළ යුතු ය.

පහත සඳහන් අන්තර්ජාල සාධක අදාළ මානව හිමිකම් අතරට අයත් වේ. ප්‍රකාශනයේ නිදහස (තොරතුරු සඳහා අයිතිය ද එයට ඇතුළත් වේ.); පෞද්ගලිකත්වය සහ දත්ත රැකවරණය සඳහා හිමිකම; ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම්; ස්ත්‍රී පුරුෂ සමාජභාවී හිමිකම්.

මෙම හිමිකම් එකිනෙක සමග සම්බන්ධ ය. උදාහරණයක් ලෙස, ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු, අන්තර්ජාල ප්‍රවේශයට සහ අන්තර්ජාලයේ මධ්‍යස්ථභාවයට අදාළ වේ. බහු භාෂිකත්වය සහ සංස්කෘතික විවිධත්වය විසින් සුළුතර හිමිකම් ආරක්ෂා කිරීම දිරිගැන්වේ. පෞද්ගලිකත්වයේ ආරක්ෂාව තහවුරු කිරීම සයිබර් හිංසනය සමග මෙන් ම සයිබර් සුරක්ෂාව සමග ගනුදෙනු කිරීමේදී ද වැදගත් වේ.



[1] Net neutrality is the principle that internet service providers (ISPs) must treat all internet communications equally, and not discriminate or charge differently based on user, content, website, platform, application, type of equipment or method of communication. More: https://www.eff.org/issues/net-neutrality

## කාන්තාවන්ට එරෙහි තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය

ඩිජිටල් සුරක්ෂිතභාවය යනු ඩිජිටල් තාක්ෂණයන් භාවිතා කරන සෑම කෙනෙකුට ම අදාළ කාරණාවකි. කෙසේ වෙතත්, අන්තර්ජාලයේදී හිංසනය සම්බන්ධයෙන් සහ සයිබර් සූරාකෑම සම්බන්ධයෙන් සලකා බැලූ විට කාන්තාවන් සහ ළමයින් අනුපාතයට වඩා වැඩියෙන් ඉලක්ක වන බව පෙනේ. එබැවින් ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රමුඛ අවධානය යොමු විය යුතු ය.

කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිකයන් සිය කටයුතුවලදී ඩිජිටල් තාක්ෂණික මෙවලම් භාවිතා කිරීම දිරිගන්වන ගෝලීය සිවිල් සමාජ සංවිධාන ජාලයක් වන ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමය (APC) විසින් අවධාරණය කරන පරිදි, තාක්ෂණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වයේ වැඩිවීමක් දක්නට ලැබේ.

APC පවසන පරිදි, කාන්තාවන්ට එරෙහි තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වයේ සුලබ ම ස්වරූපය වන්නේ සයිබර් ස්ටෝකිං හෙවත් හඹා එමින් හිරිහැර කිරීම, ලිංගික හිංසනය, පරීක්ෂාවට ලක් කිරීම සහ රූප සහ වීඩියෝ වැනි කාන්තාවන්ගේ පෞද්ගලික තොරතුරු අනවසරයෙන් පාවිච්චි කිරීමයි.

මෙම උල්ලංඝනයන් වැඩි වන අතර, බොහෝ කාන්තාවන් සහ ගැහැණු ළමයින් වින්දිතයන් බවට පත් වේ. හිංසනයන්ට ලක් වීම වළක්වා ගැනීම සඳහා කළ යුතු දේ, වාර්තා කළ හැකි තැන් සහ උදව් බලාපොරොත්තු විය හැකි කාගෙන් ද යන්න ඔවුන් දන්නේ නැත.

මෙම නව ආකාරවල ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිපත්ති, රෙගුලාසි සහ සේවා බොහෝ රටවල නැත. නැතිනම් ප්‍රමාණවත් නැත. මෙක්සිකානු ක්‍රියාමාලා ක්‍රියාකාරිකයන් වන Luchadoras සහ SocialTic සමග එක්ව, APC විසින් අන්තර්ජාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සිදු වන ආකාරයන් 13ක ලැයිස්තුවක් සකස් කර තිබේ.

"කාන්තාවන්ට එරෙහි අන්තර්ජාල ප්‍රචණ්ඩත්වය බාහිර සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම් කිරීම්වල සහ අසමානත්වයේ ප්‍රකාශනයකි. අන්තර්ජාලයේදී එය වැඩි වේ."

**JAC SM KEE, APC** කාන්තා හිමිකම් වැඩසටහන් කළමනාකාර, ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමය

For a more detailed discussion on human rights online, see:
[2]https://dig.watch/baskets/human-rights
[3] https://www.genderit.org/resources/13-manifestations-gender-based-violence-using-technology

### අනවසර ප්‍රවේශය සහ ප්‍රවේශය පාලනය කිරීම

Unauthorised attacks to gain access to a person's accounts or devices. These can imply unauthorised information gathering and/or blocking access to a person's account.

### තොරතුරු පාලනය කිරීම සහ ඒවා වාසිය සඳහා පාවිච්චි කිරීම

Information gathering or theft that can imply a loss of control over such information, and any unauthorised attempt at modifying it.

### පුද්ගලයන් ලෙස පෙනී සිටීම හා අනන්‍යතා සොරකම් කිරීම

The use or forgery of someone's identity without their consent.

### හොරෙන් නිරීක්ෂණය කිරීම හා හඹා එමින් හිරිහැර කිරීම

The constant monitoring of a person's activities, everyday life, or information (be it public or private).

### අපහාසාත්මක කතා

Speech reflecting cultural models that assign women and gender-non-conforming bodies a secondary, sexualised or strictly reproductive role. Such speech may or may not incite violence.

### හිංසනය

Repeated and unsolicited acts against a person that are perceived as intrusive, disturbing or threatening. These acts may or may not be sexualised.

### තර්ජන

Speech and content (verbal or written, in images, etc.) with a violent, sexually aggressive or threatening tone that express an intention to harm a person, their family or friends, or their belongings.

### කැමැත්තෙන් තොරව පෞද්ගලික තොරතුරු බෙදාහැරීම

The unauthorised sharing or publication of any kind of information, data or private details regarding a person.

### බිය ගැන්වීම්, තර්ජනය කර යම් දේ ලබාගැනීම

Forcing a person to act according to another persons' will, through threats and intimidation regarding something of value (e.g. personal information, intimate images, etc.)

### හෙළාදැකීම

Defamation, smearing and/or undermining of the credibility, professional career, work or public image of a person, group or initiative, through the spreading of false, manipulated or off-topic information.

### තාක්ෂණය ආශ්‍රිත ලිංගික අපචාර සහ සූරාකෑම

The act of exercising power over someone based on the sexual exploitation of their pictures and/or body against their will, where technology is a fundamental means.

### සන්නිවේදන මාධ්‍යවලට ප්‍රහාර එල්ල කිරීම

Deliberate tactics and actions aimed at putting a person's or group's communication or information channels out of circulation.

### නියාමනය සිදුකරන්නන් විසින් කරනු ලබන බැහැර කිරීම්

Contempt or lack of interest, acknowledgment or action by actors (authorities, internet intermediaries, institutions, communities) who have the possibility of regulating, resolving, and/or penalising technology-related assaults.

# 13 MANIFESTATIONS OF GENDER-BASED VIOLENCE USING TECHNOLOGY

LUCHADORAS

SOCIALTIC
Tecnología digital para el cambio social

APC
ASSOCIATION FOR PROGRESSIVE COMMUNICATIONS

https://www.genderit.org/resources/13-manifestations-gender-based-violence-using-technology

## සයිබර් සූරාකෑම හා ප්‍රචණ්ඩත්වය

සයිබර් සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය යනු වධ දීම, තර්ජනය කර වාසි ලබා ගැනීම, හිංසනය, ගොදුරු කරගැනීම, අපකීර්තියට ලක්කිරීම, බලහත්කාරයන් පෑම හෝ වෙනත් ආකාරවලින් පුද්ගලයකුට මානසිකව, ශාරීරිකව හෝ භාවමය යහපැවැත්මට හානි සිදුකිරීමයි.

ආන්තීකරණය කරන ලද ප්‍රජාවන් වෙනුවෙන් අන්තර්ජාලයේදී මෙන් ම සැබෑ ලෝකයේදී ද සුරක්ෂිත අවකාශ ඇතිකිරීම වෙනුවෙන් ක්‍රියා කරන ශ්‍රී ලාංකික සංවිධානයක් වන ග්‍රාස්රූටඩ් ට්‍රස්ට් (Grassrooted Trust) විසින් කළමනාකරණය කරනු ලබන Bakamoono.lk වෙබ් අඩවිය දක්වන පරිදි සයිබර් සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය බොහෝ ආකාරවලින් සිදු විය හැකි ය.

- ට්‍රොල් කිරීම (අන්තර්ජාලයේදී) යනු අහඹු, කැමැත්තක් රහිත හා/ හෝ මතභේදාත්මක අදහස් පළකිරීම් අන්තර්ජාලයේදි සිතාමතා කිරීමයි. එයින් සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන්නේ පරිශීලකයා තුළ ආවේගශීලී ප්‍රතිචාරයක් නිර්මාණය කිරීම හා වාදයක පැටලීමයි.

- සයිබර් ස්ටෝකිං (Cyberstalking) හෙවත් බලහත්කාර පසුහැඹීම යනු අපරාධමය භාවිතාවකි. එහිදී පුද්ගලයෙක් යම් පුද්ගලයකුට හිංසා හා තර්ජන කිරීම සඳහා අන්තර්ජාලය ක්‍රමානුකූලව භාවිතා කරයි. මෙම අපරාධය ඊමේල්, සමාජ මාධ්‍ය, චැට් අවකාශ, ක්ෂණික පණිවුඩ සහ වෙනත් අන්තර්ජාල මාධ්‍ය භාවිතා කරමින් සිදු කළ හැකි ය. අන්තර්ජාලයෙන් බැහැර හඹා එමින් හිරිහැර කිරීම සමග ද මෙය සිදුවිය හැකි ය.

- අනන්‍යතා සොරකම යනු අනවසරයෙන් පෞද්ගලික තොරතුරු එක්රැස් කිරීම සහ ඒවා භාවිතා කර ණය කාඩ් සහ බැංකු ගිනුම් ආදිය විවෘත කිරීම, ලිපි යොමු කරගැනීම, ජංගම දුරකථන දායකත්ව ලබාගැනීම ආදිය සඳහා භාවිතා කිරීමත් ය. අන්තර්ජාලයේ සහ සැබෑ ලෝකයේ වෙනත් පුද්ගලයකු ලෙස පෙනී සිටීම සාපරාධී ක්‍රියාවකි.

- සයිබර් හිංසනය යනු පුද්ගලයකු තවත් අයෙකුට හෝ අයවලුන්ට සමාජ මාධ්‍ය භාවිතා කරමින් හිංසා හෝ කරදර හෝ කිරීමයි. හානිකර හිංසා කිරීම් අතර කටකතා පැතිරවීම, තර්ජන, ලිංගික ප්‍රකාශ, වින්දිතයකුගේ පෞද්ගලික තොරතුරු ප්‍රසිද්ධ කිරීම හෝ ජාතිවාදී හෝ ලිංගික වශයෙන් අපහාසාත්මක ප්‍රකාශ හෙවත් වෛරී ප්‍රකාශ භාවිතා කිරීම මේ අතර තිබේ.

- පළිගැනීමේ ලිංගික දර්ශන යනු යමෙකුගේ කලින් ලිංගික සහකරුවකුගේ/ සහකාරියකගේ ලිංගික ස්වරූපයේ රූප සහ වීඩියෝ අන්තර්ජාලයේ පළකිරීමයි. එක් කලෙකදී විශ්වාසය මත හුවමාරු කරගත් මේවා පසු කලෙක පළිගැනීම සඳහා යොදාගනු ලැබේ.

ශ්‍රී ලාංකික සංදර්භය තුළ සයිබර් සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව අධ්‍යයන සිදු වී තිබෙන්නේ අල්ප වශයෙනි. එහෙත්, ඊට සාක්ෂි සපයන සිදුවීම් විශාල වශයෙන් තිබේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඝෝෂා සහ හෑෂ්ටැග් ජෙනරේෂන් යන ක්‍රියකාරී කණ්ඩායම් තුන විසින් මෑතදී සිදුකරන ලද අධ්‍යයනයකදී, මිලියන් හයක් ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය ෆේස්බුක්හි කාන්තාවන් පිළිබඳ සාකච්ඡා වන ආකාරය අධ්‍යයනය කරන ලදී.

සමරිසි, ද්වි ලිංගික සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව ඉලක්ක කර ගෙන සිදුවන තාක්ෂණය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ තම අත්දැකීම පිළිබඳ කරන ලද සාකච්ඡාවල සොයාගැනීම් ඔවුන්ගේ වාර්තාවේ දැක්වේ. එසේම, කොළඹින් බැහැර කාන්තා දේශපාලනඥයන් අතර කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් එක්රැස් කරගන්නා ලද තොරතුරු ද එහි දැක්වෙ.

මෙම අධ්‍යයනයේ පර්යේෂකයන් විසින් මාස හයකට වැඩි කාලයක් තිස්සේ ඉංග්‍රීසි, සිංහල හා දෙමළ ෆේස්බුක් පිටු 52ක් නිරීක්ෂණය කරන ලදී. එම පිටු අතර, දේශපාලනඥයන් වැනි පොදු ප්‍රතිරූප සහ කීර්තිමත් පුද්ගලයන්ගේ පිටු ද විය.

එම අධ්‍යයනයේ මෙසේ දැක්වේ: "ලිංගවාදී, කාන්තාවන් වස්තු බවට පත් කරන, හිංසාවට ලක්කරන හෝ එසේ නොමැතිනම්, කාන්තාවන් හෝ සමරිසි, ද්වි ලිංගික සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවේ පිරිස් ඉලක්ක කරන වෛරී ප්‍රකාශ රටාවක් මතු වී තිබෙනු පැහැදිලිව දැකිය හැකි ය. අති පෞද්ගලික ඡායාරූප සහ වීඩියෝ කැමැත්තකින් තොරව බෙදාහැරීම මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණය කරන ලද තවත් කරදරකාරී ප්‍රවණතාවකි. ඇතැම් පිටු මුළුමනින් ම වෙන් කර තිබුණේ එවැනි අන්තර්ගතයන්ට හෝ තුන්වන පාර්ශ්වයන්හි තිබෙන එවැනි අන්තර්ගතයන් බෙදාගැනීමටයි. මෙම වාර්තාවේ සොයාගැනීම්වලින් පෙනී යන්නේ ලිංගවාදී අදහස් පළකිරීම්වල සාමාන්‍යකරණයකි. එසේම, සමරිසි, ද්වි ලිංගික සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවන්ට එරෙහිව අන්තර්ජාලයේ සහ සැබෑ ලෝකයේ සිදුවන ප්‍රචණ්ඩත්වයේ වැඩිවීමකි."

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ෆේස්බුක්හි සුලබව පවතින ලිංගවාදය සහ පුරුෂෝත්තමවාදය මෙම අධ්‍යයනය විසින් අවධාරණය කර තිබේ. මෙය ශ්‍රී ලාංකික සමාජයේත්, ෆේස්බුක්හිත් පවතින අනියම් ලිංගවාදයේ දිගුවක් බව පර්යේෂකයන්ගේ විශ්වාසයයි. මෙය සාමාන්‍යයෙන් සැලකෙන්නේ 'හාස්‍යයී ලෙසයි. පිටු හා සටහන් විසින් කාන්තාවන් ආරක්ෂා කරන බව පෙන්වමින් ඇත්තෙන් ම ඔවුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පතුරුවන අවස්ථා තිබේ.

බොහෝ පසුහඹන්නන් (followers) සහ අදහස් පළකරන්නන් විසින් අන්තර්ජාලයේ නිර්නාමිකත්වය පාවිච්චි කරනු ලබන්නේ ව්‍යාජ අනන්‍යතා වෙනුවෙනි. එබැවින් එවැනි පිටු පිළිබඳ ෆේස්බුක් පරිපාලකවරුන්ට දැනුම් දීම දුෂ්කර වේ. ෆේස්බුක් ප්‍රජා ප්‍රමිතීන් මගහැර යාම සඳහා භාවිතා කරන ක්‍රම එම පුද්ගලයන් විසින් සොයාගෙන තිබෙන බව ද අධ්‍යයනය විසින් සොයාගෙන තිබේ. ඒ සඳහා ක්‍රම වන්නේ සම්බන්ධතා පමණක් පළ කිරීම, රූප මත අක්ෂර යෙදීම, පළකිරීම් බෙදාහදාගැනීම නොකර ලයික් කිරීම පමණක් කිරීම ආදියයි.

[4] https://groundviews.org/2019/06/27/opinions-btch-technology-based-violence-against-women-in-sri-lanka/

“මව්පියන් සහ ඒ ගැන සැලකිලිමත් වන වැඩිහිටියන් ලෙස අපගේ ප්‍රතිචාර ලෙස සමාජ මාධ්‍ය හෝ ජංගම උපකරණ භාවිතාය තහනම් කිරීම සිදු කළ නොහැකි ය. අන්තර්ජාලයේ සිටීමෙහි වාසිය වන්නේ එහි දී දැනුම එක්රැස් කිරීම හා බෙදාහැරීම ඉතා පුළුල් වීමයි. අන්තර්ජාල ලෝකය යනු අප එකිනෙකා සමග සන්නිවේදනය සිදු කරන තවත් අවකාශයකි. එහිදී අප විසින් සම්බන්ධතා ගොඩනගාගනු ලැබේ. අන්තර්ජාලයේදී මෙන් ම සැබෑ ලෝකයේදී ද සියලු අන්තර්ක්‍රියාවලදී අප තමන්ටත්, අනෙකාටත්, වෙනස්කම්වලටත් සංවේදී විය යුතු අතර ඒවාට ගරු කළ යුතු ය.”

BAKAMOONO.LK

“අන්තර්ජාලයේ සහ සැබෑ ලෝකයේ ප්‍රචණ්ඩත්වය යනු දෙකක් ය කියන ව්‍යාජ අදහසට අභියෝග කිරීමේ වැඩි හැකියාවක් දැන් අපට තිබේ. තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය හුදකලාව පවතින්නක් නොවේ. එය කාන්තාවන්, ගැහැණු ළමයින් සහ සමරිසි, ද්වි ලිංගික සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයේ ම ඓන්ද්‍රිය ස්වරූපයක් හා දිගුවකි. තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය සිදුවන්නේ සම්පූර්ණයෙන් ම අන්තර්ජාලයේ නොවේ. දුරකථන ඇමතුම් හා කෙටි පණිවුඩ ද මේ වර්ගයට අයත් වේ. කාන්තාවන්ට පෞද්ගලිකත්වයට, අධ්‍යාපනයට, වැඩ කිරීමට සහ සෞඛ්‍යයට ඇති අයිතිය සම්බන්ධයෙන් තිබෙන බලපෑම ඇත්තේ හුදෙක් ම අන්තර්ජාලයේ පමණක් නොවේ. පොදු හා පෞද්ගලික අවකාශයන්ගේ පවතින එම වෙනස්කම් කිරීම්, ප්‍රචණ්ඩත්වයන් සහ අවේක්ෂණයන් අන්තර්ජාලයේ පරාවර්තනය වන අතර ඇතැම් අවස්ථාවලදී වැඩි වේ.”

OPINIONS, B*TCH: TECHNOLOGY-BASED VIOLENCE AGAINST WOMEN IN SRI LANKA
(විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඝෝෂා සහ හැෂ්ටැග් ජෙනරේෂන්)

## සමාජ මාධ්‍ය
## ප්‍රජා ප්‍රමිති

සියලු ප්‍රධාන සමාජ මාධ්‍ය විසින් තම පරිශීලකයන්ට නව නීති පනවා තිබේ. ඒවා හඳුන්වනු ලබන්නේ ප්‍රජා ප්‍රමිති ලෙසයි. ගිනුමක් ආරම්භයේදී ම සෑම අයෙකු ම මෙම නීති අනුගමනය කිරීමට එකඟ වේ. නිදසුනක් ලෙස ලොව විශාලතම සමාජ මාධ්‍ය ජාලය වන ෆේස්බුක්හි 2019 මාර්තු 31 වන විට මසකට සක්‍රිය පරිශීලකයන් බිලියන 2.38ක් සිටිති. මෙම පරිශීලකයන් සෑම දිනක ම දිවා රාත්‍රී අන්තර්ගතයන් බිලියන් ගණනක් ජනනය කරති. මෙම ගෝලීය සංවාදයේ වැඩි කොටසක් හානියකින් තොර ය. එහෙත්, හැම අයෙකු ම නීතිය අනුව කටයුතු කරන්නේ නැත. ෆේස්බුක්හි ප්‍රජා ප්‍රමිති විසින් තම වේදිකාවෙහි අවසර තිබෙන හා නැති දේ පැහැදිලිව දක්වා තිබේ.

බලන්න: **https://www.facebook.com/communitystandards/**

“අපගේ ප්‍රජා ප්‍රමිතිවල අරමුණ වන්නේ ප්‍රකාශනය දිරිගැන්වීම් සහ සුරක්ෂිත වාතාවරණයක් නිර්මාණය කිරීම ය. අප අපගේ ප්‍රතිපත්ති පදනම සකස් කරන්නේ අපගේ ප්‍රජාවේ සහ ක්ෂේත්‍ර විශේෂඥයන්ගේ උපදෙස් මත ය. එම විශේෂඥයන් අතර තාක්ෂණික හා මහජන ආරක්ෂාව පිළිබඳ විශේෂඥයන් සිටිති,” යි එහි හැඳින්වීමේ දැක්වේ.

ෆේස්බුක් පවසන පරිදි එහි නීති සකසා තිබෙන්නේ කුලුනු තුනක් මත ය. ඒවා නම්, සුරක්ෂිතබව (වෙනත් අයට හානි කරන අන්තර්ගතයන් ඉවත් කිරීම), හඬ (විවිධ පරිශීලකයන්ට විවිධ දැක්මවල් හා අදහස් ඉදිරිපත් කිරීමට හැකි වීම) සහ සමානාත්මතාවයි (සියලු පරිශීලකයන්ට එකම ප්‍රමිති භාවිතා කිරීම).
ප්‍රචණ්ඩත්වය සහ අපරාධකාරී චර්යාවන් දිරිගන්වන අන්තර්ගතයන්ට නීතියෙන් ඉඩ නැත. ඒ අතරට ත්‍රස්තවාදය සහ වෛරී කණ්ඩායම්, මිනිස් ජාවාරම සහ සංවිධානාත්මක අපරාධ අයත් වේ. එමගින් මත්ද්‍රව්‍ය හා ගිනි අවි වැනි “නියාමනයට යටත් කර තිබෙන භාණ්ඩ” අලෙවිය ද තහනම් කර තිබේ. ස්වයං හානි හෝ සියදිවිනසාගැනීම් ප්‍රවර්ධනය කරන පළ කිරීම් ෆේස්බුක් විසින් ඉවත් කරනු ලැබේ. එසේම ළමයින්ව හෝ වැඩිහිටියන්ව ලිංගිකව සූරාකන්නන් ද ඉවත් කරනු ලැබේ.”

මීට අමතරව, රූපමය ප්‍රචණ්ඩත්වය සහ වෛරී ප්‍රකාශ වැනි විරෝධය දැක්විය හැකි අන්තර්ගතයන් ලැයිස්තුවක් ද එහි දැක්වේ. ඒවා “රැකවරණය සහිත ලක්ෂණ වන ජාතිය, ජනවර්ගය, ජාතික සම්භවය, ආගමික බැඳීම්, ලිංගික නැමියාව, ලිංගිකභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ සමාජ අනන්‍යතා සහ භයානක ආබාධ සහ රෝග ආදියට එරෙහි සෘජු ප්‍රහාරයක්”ලෙස අර්ථකථනය කරනු ලැබේ.

නීති කඩන්නන්ට ප්‍රතිවිපාක අත්විඳීමට සිදු වේ. පළමු උල්ලංඝනය සම්බන්ධයෙන් අවවාද කරනු ලැබේ. දිගින් දිගට ම වරද සිදුවන්නේ නම් පරිශීලකයාට පළ කිරීම් සම්බන්ධ සීමා පැනවේ. බරපතල වැරදිකරුවන්ගේ ගිනුම් අත්හිටවනු ලැබේ. නීතිවල මෙසේ සඳහන් වේ. “සැබෑ තර්ජනයක් සහ භෞතික හානියක් ඇති විට, ඒ පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ද දැනුම් දෙනු ලැබේ. ”

ඉන්ස්ටග්‍රෑම්, යූටියුබ් සහ ට්විටර් වැනි වේදිකාවල ද ඔවුන්ගේ ම නීති තිබේ. සමාජ මාධ්‍ය ස්වයං නියාමන උත්සාහයන් වන ඒවා කියවා තේරුම්ගන්නට අපි ඔබ දිරිගන්වන්නෙමු.

## සයිබර් සුරාකෑමට සහ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම

දැනුවත්භාවය ඇතිකිරීම හා පරිශීලක මට්ටමේ පූර්වාරක්ෂාව ඇතිකිරීම පළමු පියවර වේ.

මේ සම්බන්ධයෙන් බොහෝ අන්තර්ජාල මූලාශ්‍රවල උපකාරය ලබාගත හැකි අතර ක්‍රියාමාලා සහ ස්වයං උපකාරක සේවා කණ්ඩායම් ද තිබේ. පහත දැක්වෙන්නේ ජාත්‍යන්තර උදාහරණ දෙකකි.

- **Take Back The Tech!** යනු ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමයේ (APC) වැඩසටහනකි. විශේෂයෙන් ම එමගින් කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා තාක්ෂණය පාලනය කිරීම සඳහා සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එය කාන්තාවන්ට එරෙහි තාක්ෂණය පාදක ප්‍රචණ්ඩත්වය අවධාරණය කරන ගෝලීය සහයෝගී ක්‍රියාමාලා ව්‍යාපෘතියකි. එයට ලොව විවිධ ප්‍රදේශවල පර්යේෂණ සහ විසඳුම් අයත් වේ. සුරක්ෂා මාර්ග සිතියම්, තොරතුරු සහ ක්‍රියාමාර්ග සඳහා මගපෙන්වීම් මෙම ක්‍රියාමාලාව විසින් සපයනු ලැබේ. එමගින් වසරේ විවිධ වකවානුවලදී ක්‍රියාමාලා කීපයකට නායකත්වය දෙනු ලැබේ. එහි විශාලතම වාර්ෂික ක්‍රියාමාලාව සිදුවන්නේ නොවැම්බර් 25 සිට දෙසැම්බර් 10 දක්වා පැවැත්වෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි 16 දින ක්‍රියාකාරිත්වය අතරතුරදී ය.
  https://www.takebackthetech.net/

- සුරක්ෂිත අන්තර්ජාල දිනය **(SID)** අන්තර්ජාල භාවිතයේදී ඇති වන අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ ජාත්‍යන්තර දිනයකි. මුලින් ම 2004 දී යුරෝපා සංගමය විසින් ආරම්භ කරන ලද එය සෑම වසරක ම පෙබරවාරි මස දෙවන සතියේ දෙවන දිනට යෙදේ. SID යනු අන්තර්ජාල සුරක්ෂා දින දර්ශනයේ වැදගත් දිනයකි. එය මේ වන විට ලොව පුරා රටවල් 140ක පමණ විසින් සමරනු ලැබේ. සෑම වසරක ම සුරක්ෂිත අන්තර්ජාල දිනයේදී සයිබර් වධදීමේ සිට සමාජ ජාලගත වීම දක්වා මතු වන අන්තර්ජාල ප්‍රශ්න පිළිබඳ දැනුවත් කිරීම හා සාකච්ඡා සිදු වේ.
  https://www.saferinternetday.org/


ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ හා ක්‍රියාකාරී කණ්ඩායම් කීපයක් විසින් ඩිජිටල් සුරක්ෂිතභාවය සහ/ හෝ ඩිජිටල් වගකීම පිළිබඳ තොරතුරු, උපදෙස් සහ සහාය සපයනු ලැබේ.

- **Grassrooted Trust** පිහිටුවනු ලැබුවේ ආන්තීකරණය වූ ප්‍රජාවන්ට අන්තර්ජාලයේදී සහ සැබෑ ලෝකයේදී සුරක්ෂිත අවකාශයන් පිහිටුවනු පිණිස ය.
  http://www.grassrooted.net/

- **Bakamoono.lk** යනු ග්‍රාස්රූටඩ් ට්‍රස්ට් සහ එහි හවුල්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ත්‍රිභාෂා වෙබ් අඩවියකි. එහි කටයුතුවල අවධානය යොමුවන්නේ ලිංගිකත්වය සහ සම්බන්ධතා අදාළ ප්‍රශ්න කෙරෙහි ය. ඒ අතරට කැමැත්ත, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සයිබර් සුරාකෑම සහ ප්‍රචණ්ඩත්වය ගැන තොරතුරු අයත් වේ.
  http://www.bakamoono.lk/en

- කාන්තා පිහිට **(WIN)** යනු, ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණ දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කැපවුණ සංවිධානයකි. එහි නීතිඥයන් සහ මනෝ උපදේශන සේවා සපයන්නන් කණ්ඩායමක් සිටිති.
  https://www.winsl.net/

- ශිල්ප සයුර පදනම තරුණයන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම ප්‍රවර්ධනය කරන සංවිධානයකි. 'ගැහැණු ළමයාට ගරු කරන්නී නම් වූ වැඩසටහනක් එම ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබේ. එය සමාජ ජාලවලදී ගැහැණු ළමයින් මුහුණ දෙන සයිබර් වධදීම පිළිබඳ ක්‍රියා කරන ස්වේච්ඡා මුලපිරුමකි. (මෙම මොඩියුලයේ සිද්ධි අධ්‍යයනය - 1 බලන්න)
  http://www.shilpasayura.org



[5] http://counterpoint.lk/violence-is-violence-offline-or-online/

## සයිබර් සූරාකෑමක් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තා කරන ආකාරය

සයිබර් හිංසනය සම්බන්ධයෙන් නිල වශයෙන් කටයුතු කරන ආයතන තුනක් තිබේ.

- ජාතික ළමාරක්ෂක අධිකාරිය (NCPA) විසින් වයස අවුරුදු අවුරුදු 18ට අඩු වින්දිතයන් සහ වරද කරන්නන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.
- පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අවරාධ අංශය වයස අවරුදු 18ට වැඩි වින්දිතයන් පිළිබඳ ක්‍රියා කරයි.
- ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා සහ සූදානම් කිරීමේ කණ්ඩායම (SL-CERT) විසින් ද ලැබෙන පැමිණිලි වාර්තා කරගනු ලබන අතර ඒවා ඉහත දක්වන ලද ආයතන දෙකට ප්‍රතිචාර දැක්වීම සඳහා යොමු කරනු ලැබේ.

ජාතික ළමාරක්ෂක අධිකාරිය ද සෑම ආකාරයක ම ළමා අපචාර සම්බන්ධයෙන් පවත්නා නීති විවරණය කිරීම හා ශක්තිමත් කිරීම පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන් සමග කටයුතු කරයි.

ඔබගේ පිංතූරයක් හෝ වීඩියෝවක් හෝ, ඔබ දන්නා යම් අයෙකු විසින් අන්තර්ජාලයට මුදාහැර තිබේ නම්, ඒ පිළිබඳ CERT වෙත 011 2 691 692 දුරකථන අංකය ඔස්සේ වහා දැනුම් දෙන්න. ඔබට අවශ්‍ය උපකාර බලාපොරොත්තු වූ පරිදි නොලැබේ නම්, 011 471 85 85 ඔස්සේ කාන්තා පිහිට අමතා සිද්ධිය වාර්තා කරන්න.

වින්දිතයා වයස අවුරුදු 18ට වැඩි නම්, ඔබ පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය 011 232 6979 දුරකථන අංකය ඔස්සේ අමතන්න. විස්තර පහත දැක්වෙන ඊමේල් ලිපින දෙකට ම දැනුම් දෙන්න. <dir.cid@police.lk> සහ <telligp@police.lk>

වින්දිතයා වයස අවුරුදු 18ට අඩු නම්, ජාතික ළමාරක්ෂක අධිකාරියේ 1929 හදිසි දුරකථන අංකය ඔස්සේ අමතන්න. ඔවුන්ගේ වෙබ් අඩවිය මෙසේ ය: http://www.childprotection.gov.lk/

පහත දැක්වෙන්නේ ග්‍රාස්රූටඩ් ට්‍රස්ට් විසින් ඔවුන්ගේ වෙබ් අඩවියේ දක්වා තිබෙනෙ සාක්ෂි හා තොරතුරු සංරක්ෂණය කිරීම පිළිබඳ උපදෙස් කීපයකි.

- ඔබ බ්ලැක්මේල් කිරීමකට හෙවත් අවමානයකට තර්ජනයකට ලක් වී තිබේ නම්, කවර මාධ්‍යයක දී හෝ වේවා, වරද කරන්නා සමග සිදු කරනු ලබන සන්නිවේදනය මකා නොදැමීමට වග බලා ගන්න. සාක්ෂි ඔබෙන් ම තහවුරු කරගැනීමට පොලිසියට අවශ්‍ය විය හැකි ය. එසේම, සාක්ෂි වෙනස් නොකිරීමට ද වගබලාගන්න. සාක්ෂි අතරට, පණිවුඩ, දුරකථන ඇමතුම් ලොග් සටහන් ආදිය අයත් වේ.

- ඔබගේ දැනුවත් වීම හා වාර්තා කරගැනීම පිණිස තිර රූප (screen shots) ලබාගන්න. ඉන්ස්ටග්‍රෑම් වැනි ඇතැම් මාධ්‍ය තුළ යවනු ලබන පණිවුඩ මකා දැමිය හැකි ය. පොලිසියට පැමිණිල්ලක් කරන විට, පොලිසියට ඔවුන්ගේ පරිගණකයෙන් අදාළ තිර රූප වාර්තාගත කළ හැකිදැයි විමසන්නැයි නීතිඥවරයාට හෝ ඔබ සමග යන පුද්ගලයාට හෝ පවසන්න. තිර රූපවල සත්‍යාසත්‍යභාවය තහවුරු කරගැනීමට ඒවා වැදගත් වේ.

- ජංගම දුරකථනයක් පොලිසියට භාර දේ නම්, ඔබ ඊට පෙර සියලු සාක්ෂිවල තිර රූප ලබාගත යුතු ය. දුරකථනයේ ඇති සියලු අදාළ දේවල ලැයිස්තුවක් සකසා එය ද සමග ජංගම දුරකථනය පොලිසියට භාරදෙන්න. එය භාර දුන් දේ සම්බන්ධ පැහැදිලි සාක්ෂියකි.

- සිදු වී තිබෙන සෑම දෙයක් සම්බන්ධයෙන් ම වාර්තාවක් තබාගන්න. උදාහරණයක් ලෙස තර්ජනාත්මක දුරකථන ඇමතුම්/ කෙටි පණිවුඩ කාලයක් තිස්සේ ලැබේ නම්, ඒවා ලැබෙන දින/ වේලාවන් හැකි තරම් නිවැරදිව සටහන් කරගන්න. පොලිසියට පැමිණිලි කරන විට දින වකවානු සහිත විස්තරයක් ප්‍රයෝජනවත් විය හැකි ය. එමගින් සිදුවීම මතක තබාගත හැකි අතර, පැමිණිලි කිරීම හෝ සාක්ෂි ලබාදීම හරියාකාරව සිදු කළ හැකි ය.



[6] http://www.bakamoono.lk/en/article/2600/how-to-report-cases-of-cyber-exploitation-and-violence

## සයිබර් හිංසනයට එරෙහි නීතිමය රැකවරණය

2019 වසරේ මැද වනතුරු ම ශ්‍රී ලංකාවේ සයිබර් හිංසනය සාපරාධී වරදක් ලෙස සැලකීම සඳහා නීති ප්‍රතිපාදන තිබුණේ නැත.

කෙසේ වෙතත්, දණ්ඩ නීති සංග්‍රහයේ ඇතැම් කොටස් විසින් එහි ඇතැම් අංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යොදාගත හැකි ය:

- දණ්ඩ නීති සංග්‍රහයේ 345 කොටස ලිංගික හිංසනය සමග සම්බන්ධ ය. (එහිදී ලිංගික හිංසනය කෙනෙකු පීඩාවට හෝ හිංසනයට පත් කිරීම සඳහා වචන භාවිතය හෝ ක්‍රියාකාරකම් ලෙස ද අර්ථ නිරූපණය කෙරේ.)
- දණ්ඩ නීති සංග්‍රහයේ 372 කොටසෙහි තර්ජනයෙන් පැහැරගැනීම (පුද්ගලයකුට දේපල හෝ වටිනා සුරක්ෂිත දෙයක් ලබාදීමට බල කරමින් සිතාමතා තුවාල කරන බවට බියපත් කිරීමේ ක්‍රියාවක් ලෙස අර්ථ නිරූපණය කර තිබේ.)
- 483 කොටස අනුව, යම් ස්වරූපයක දණ්ඩනයකින් වැළකී සිටීම සඳහා ක්‍රියාවක් කිරීමට හෝ නොකර සිටීමට පුද්ගලයකුට එරෙහිව යොදන සාපරාධී බලහත්කාරය හෝ තර්ජනය

මේ අතරින් 372 සහ 483 කොටස්, ඩිජිටල් මාධ්‍ය යොදාගෙන ගන්නා ලද හෝ ගබඩා කරගන්නා ලද පෞද්ගලික ඡායාරූප හෝ වීඩියෝ යොදාගෙන කරන අවමන් තර්ජනය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යොදාගත හැකි ය.

අසභ්‍ය ප්‍රකාශන පනත (1927 හා පසුව එක් කරන ලද සංශෝධන) යටතේ, පෞද්ගලික, රහස්‍ය ඡායාරූප කැමැත්තෙන් තොරව බෙදාහදාගැනීම හෝ සංස්කරණ මෘදුකාංගයක් භාවිතා කරමින් දැඩි වෙනස්කමකට ලක් කරන ලද ඡායාරූප බෙදාහදාගැනීම අභියෝගයට ලක් කළ හැකි ය. 2 කොටස යටතේ අසභ්‍ය ඡායාරූප ළඟ තබාගැනීම, බෙදාහැරීම හෝ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීම වරදක් වේ.

2006 අංක 30 දරණ ගෙවුම් උපාංග වංචා පනත (Payment Devices Frauds Act) 3 කොටස යටතේ ගෙවුම් උපකරණ භාවිතා කර සිතාමතා වංචනික ලෙස මුදල් ගැනීම වරදකි. අවමන් තර්ජන සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මෙය යොදාගත හැකි ය.

2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත අනුව පුද්ගලයන් පරිගණකයකින් හෝ දත්ත ගබඩා උපකරණයකින් අවසරයකින් තොරව තොරතුරු ලබාගැනීම වරදකි. එම තොරතුරු උඩුගත කිරීම, බාගත කිරීම හෝ ඒවායේ පිටපත් ලබාගැනීම ද නීතිමය වරදකි.

**මෙම නීතිමය විධිවිධාන තිබියදීත්, වින්දිතයන්ට අන්තර්ජාලයෙන් කරන ලද අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ලබාගැනීම පහසු නැත. අන්තර්ජාල අපරාධ අධිකාරීන් වෙත වාර්තා කිරීමේ පද්ධතියේ තිබෙන අඩුපාඩු හේතුවෙන් බොහෝ වින්දිතයන් නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ නැත. ඊට අමතරව, බොහෝ බේරුණු පුද්ගලයන්ට නීතිඥ සහාය ලබාගැනීම ද පහසු නැත.**

## සිද්ධි අධ්‍යයන

### සිද්ධි අධ්‍යයනය 1: අන්තර්ජාලයේ ගැහැණු ළමයින්ට ගරු කිරීම

වසර කීපයකට පෙර, පූර්ණිමා මීගම්මන ඇගේ උසස් පෙළ විභාගයට සූදානම් වෙමින් සිටියා ය. විභාගය ආරම්භ වන්නට පෙර දිනයේ ඇයට කිසිවකු විසින් අසභ්‍ය පණිවුඩ කීපයක් එවා තිබිණි. ඒවා එවා තිබුණේ විශ්වසනීය ලෙස පෙනුණු පිරිමි මිතුරකුගේ ෆේස්බුක් ගිනුමෙනි.

“එය දැක්කාම මා තිගැස්සුණා. කළ යුත්තේ කුමක් ද කියා තේරුණේ නැහැ. යහළුවෙකුගෙන් එවැනි දෙයක් ලැබෙයි කියා මා සිතුවේ නැති තරම්. එයින් මා මානසික අසහනයට පත් වුණා. අප දෙදෙනා ම දැන සිටි වෙනත් අයෙකු අවසරයකින් තොරව මගේ මිතුරාගේ ෆේස්බුක් ගිනුමට පිවිස ඒ පණිවුඩ එවා ඇති බව මා දැනගත්තේ පසුවයි.”

පූර්ණිමාට පවුලේ අයගෙන් සහ සමීප මිතුරන්ගෙන් ලැබුණු සහයෝගය සහ අවබෝධය නිසා මෙම අසහනකාරී තත්වය මගහරවාගත හැකි වුණා. එහෙත්, මෙම තත්වය පුළුල් ලෙස පැතිරී ඇති බව සහ එමගින් ගැහැණු ළමයින් හා කාන්තාවන් විශේෂයෙන් ඉලක්ක කරනු ලබන බවත් ඇය තේරුම් ගත්තා.

මෙම කටුක අත්දැකීම සාධනීය ක්‍රියාමාර්ගයකට හරවමින් ඇය විසින් ‘අන්තර්ජාලයේදී ගැහැණු ළමයාට ගරුකරන්නී යන ස්වේච්ඡා මුලපිරුම පටන් ගත්තා. එහි අරමුණ වුණේ සමාජ ජාලවලදී, ස්වංයං හානි වැනි ආන්තික ක්‍රියා ද ඇතුළත්, සයිබර් හිංසනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. මෙම ප්‍රයත්නය ක්‍රියාත්මක කරනු ලබන්නේ ශිල්ප සයුර පදනම නම් ලාභ නොලබන ආයතනය විසිනුයි.

බොහෝ නව යොවුන් පුද්ගලයන් අන්තර්ජාලය භාවිතා කිරීම ආරම්භ කරන්නේ සයිබර් ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය පිළිබඳ කිසිදු දැනුමකින් තොරව බව පූර්ණිමා පවසයි. සයිබර් වධදීම්වලට මුහුණ දෙන තරුණ පුද්ගලයන්ට සමාජ ජීවිතයෙන් සහ ඩිජිටල් කටයුතුවලින් ඉවත් වන්නට සිදු වේ. එසේම, අධ්‍යාපන හෝ රැකියා කටයුතුවලට ද භෞතික හා/ හෝ මානසික බලපෑම් සිදු වේ.

“රැකවරණය සඳහා නීති හා ක්‍රියාමාර්ග තිබෙනවා. ඒත්, ඒ පිළිබඳ දැනුවත්භාවය, උපදෙස් සහ මූලාශ්‍ර, විශේෂයෙන් ම දේශීය භාෂාවන්ගෙන්, යුක්තිය සොයන වින්දිතයන්ට ලබාගැනීම අපහසුයි. ගැහැණු ළමයාට ගරු කරන්න ව්‍යාපෘතියෙන් කරන්නේ ප්‍රශ්නය පිළිබඳ දැනුවත් කිරීම සඳහාත්, සුරක්ෂිත සහ ගෞරවනීය අන්තර්ජාල කතිකාවක් සහ සහකම්පනය ප්‍රවර්ධනය කිරීම සඳහාත් ක්‍රියාකාරී වීම සඳහාත් ක්‍රියා කිරීමයි. ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිඵලයක් වන්නේ අලුතෙන් අන්තර්ජාලයට එක් වන නව යොවුන් පුද්ගලයන්, ගුරුවරුන් හා මව්පියන් සඳහා වන සයිබර් පෞද්ගලිකත්වය පිළිබඳ විද්‍යුත් අත්පොතයි.

ගැහැණු ළමයාට ගරු කරන්න ව්‍යාපෘතිය සයිබර් හිංසනය වැළැක්වීම සඳහා ක්‍රියා කරන තරුණ ජාලයක් ලෙස හා වින්දිතයන් සඳහා උපකාරක කණ්ඩායමක් ලෙස ද ක්‍රියාත්මක වේ.

වසර 2017දී, අන්තර්ජාල සමාජය විසින් පූර්ණිමා 25Under25 සම්මානය සඳහා තෝරාගන්නා ලදී. එය යහපත් බලවේගයක් ලෙස අන්තර්ජාලය භාවිතා කරන ලොව පුරා තරුණ පුද්ගලයන් වෙනුවෙන් පිරිනමනු ලබන සම්මානයකි.

More: http://respect-girls-on-internet.blogspot.com/
https://www.internetsociety.org/25th/25-under-25/awardees
https://www.bbc.com/sinhala/sri-lanka-41218095

## සිද්ධි අධ්‍යයන 2: ශ්‍රී ලංකාවේ පළිගැනීමේ අසභ්‍ය දර්ශන

පළිගැනීමේ අසභ්‍ය දර්ශන යනු අකැමැත්තෙන් බෙදාහරිනු ලබන හෝ අන්තර්ජාලයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන අතිශය පෞද්ගලික රූප හෝ වීඩියෝ ය. මෙම භාවිතාව ශ්‍රී ලංකාවේ වැඩි වෙමින් පවතී. එහෙත්, බොහෝ වින්දිතයන් වාර්තා කිරීමට හෝ නීතිමය උපදෙස් පැතීමට කැමැත්තක් දක්වන්නේ නැත.

ග්‍රාස් රූටඩ් ට්‍රස්ට් හි ස්ත්‍රීවාදී ක්‍රියාකාරිනියක හා පර්යේෂිකාවක වන ශරන්‍යා සේකරම් විස්තර කරන පරිදි, ඔවුන් විසින් හෙළිදරව් කරගෙන තිබෙන පළිගැනීමේ අසභ්‍ය දර්ශන ජාල බොහෝ ගණනක් අතරින් එකක් වට්සැප් කණ්ඩායමකි. මෙම කණ්ඩායමේ සාමාජිකයකු වීමට නම් සෑම පුද්ගලයෙකු ම නිරුවත් කාන්තාවන්ගේ පැහැදිලි රූප පහක් ඉදිරිපත් කළ යුතු ය.

"ප්‍රශ්නය වන්නේ, මෙම පිරිමි ළමයින් නිරුවත් රූප යම් ආකාරයක වත්කමක් ලෙස සිතන්නට පෙළඹී ඇත්තේ ඇයි ද යන්නයි. ඔවුන්ට මේවායේ අයිතිය ඇතැයි ඔවුන් සිතන්නේ කෙසේ ද?" ඇය විමසයි.

තවත් සිද්ධියක් විස්තර කරමින් ඇය පැවසුවේ, එහිදී ගැහැණු ළමයාගේ හිටපු පෙම්වතා විසින් ඔහු සතුටු කිරීම සඳහා වීඩියෝ දුරකථන ඇමතුමක් නොගතහොත් ඇගේ රහස්‍ය රූප බෙදාහරින බවට තර්ජනය කළ බවයි. ගැහැණු ළමයා එය ප්‍රතික්ෂේප කළ විට, වැරදිකරුවා ඇයට ප්‍රතිචාර දක්වා ඇත්තේ ඇය තම ජීවිතයේ වටිනාකම ගැන තවදුරටත් කල්පනා කර කැමති විය යුතු බවයි. නැතිනම්, ඇගේ ජීවිතය විනාශ විය හැකි බව ඔහු පැවසී ය.

"මෙයින් පෙනෙන්නේ, මෙම රූප හෝ වීඩියෝ හෝ ප්‍රසිද්ධ වූ විට වින්දිතයා මුහුණ දෙන ගැටලු පිළිබඳ වරද කරන්නන් බොහෝ විට හොඳින් දැනුවත් බවයි. සමාජය ප්‍රතිචාර දක්වන හැටි ගැන ඔවුන් හොඳින් දන්නවා. ඔවුන්ට කළ හැකි හානිය පිළිබඳ ඔවුන් හොඳින් දන්නවා."

ශරන්‍යා විශ්වාස කරන පරදි, ප්‍රශ්නයට හේතුව තාක්ෂණයට වඩා ශ්‍රී ලාංකික සංස්කෘතියේ පීතෘමූලික ආකල්පයි. ඇය පවසන පරිදි පළිගැනීමේ අසභ්‍ය දර්ශන සමීප  පුද්ගලයෙකුගේ ප්‍රචණ්ඩත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ම ලෙස සැලකිය යුතු බවයි.

“අන්තර්ජාලයේ ප්‍රචණ්ඩත්වය හුදකලා ගැටලුවක් ලෙස දකින්නට මිනිසුන් පෙළඹෙනවා. ඒත්, ඔවුන් එහි තිබෙන සම්බන්ධතා අධ්‍යයනය කරන්නෙ නැහැ,” යි ඇය පවසයි. එවැනි සිද්ධි වාර්තා කරන්නේ නම්, ශ්‍රී ලංකාවේ පවත්නා නීතියෙන් එවැනි අපරාධ සම්බන්ධයෙන් කටයුතු කළ හැකි බව ඇය පෙන්වා දෙන්නී ය. උදාහරණයක් ලෙස අසභ්‍ය ප්‍රකාශන පනතේ දෙවන කොටස සම්බන්ධ වන්නේ අසභ්‍ය රූප ළඟ තබාගැනීම, බෙදාහැරීම සහ ප්‍රදර්ශනය සමගයි.

එහෙත්, මේ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතුව තිබෙන පොදු ආයතන අකාර්යක්ෂම ය. වින්දිතයන් කෙරෙහි අසංවේදී ය. යුක්තිය සොයන අය අධෛර්යයවත් කරයි. වරදකරුවාට වඩා වින්දිතයා ලැජ්ජාවට පත් කිරීමේ සංස්කෘතිය හේතුවෙන් වින්දිතයෝ ඉදිරියට පැමිණීමට අකැමැත්තක් දක්වති.

Adapted from: https://roar.media/english/life/in-the-know/cyber-exploitation-and-violence-the-darker-side-of-cyberspace/

## සාකච්ඡා මාතෘකා

පහත දැක්වෙන්නේ මාතෘකාව පිළිබඳ වැඩිදුර විමසා බැලීම සඳහා සාකච්ඡා කරුණු කීපයකි.

- පරිශීලකයකුට තමන් සයිබර් හිංසනයෙන්, සූරාකෑමෙන් සහ අන්තර්ජාල ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කරගැනීමට කොපමණ පියවර ගත හැකි ද? පරිශීලකයාට ප්‍රායෝගිකව ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?
- “කාන්තාවන්ට එරෙහි අන්තර්ජාල ප්‍රචණ්ඩත්වය යනු පැහැදිලිව ම බාහිර සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී පදනමින් වෙනස්කම් කිරීමේ අසමානත්වයේ ප්‍රකාශනයකි. ”ඔබ මෙම ප්‍රකාශයට එකඟ ද නැද්ද යන්න සාකච්ඡා කරන්න.
- ඩිජිටල් හා සයිබර් සුරක්ෂාව ළමයින් සහ කාන්තාවන් සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රශ්නයකි. එහෙත්, වෙනත් ආන්තීකරණය කරන ලද ප්‍රජාවන් ද එහි අවදානමට ලක්වෙති. මෙම කණ්ඩායම් මොනවා ද? ඔවුන් අන්තර්ජාලයේදී ඉලක්ක වන්නේ කෙසේ ද?
- පුද්ගලයන් දෙදෙනෙකුගේ සම්බන්ධයක අති පෞද්ගලික ඡායාරූප බෙදාහදාගැනීම සුහුරු දුරකථන හා වෙබ් නිසා ඉතා පහසු ය. මෙය අත්‍යන්තයෙන් ම අනාරක්ෂිත භාවිතාවක් ද? අනුගමනය කළ හැකි පූර්ව ආරක්ෂක ක්‍රම මොනවා ද? ඒ සම්බන්ධයෙන් දිය හැකි අවවාද මොනවා ද? සාකච්ඡා කරන්න.
- ට්‍රොල් විසින් අපේක්ෂා කරන දේ නොකරන්න. ඒවා විසින් උත්සාහ කරනු ලබන්නේ අවධානය සහ සම්බන්ධ වීම ලබාගැනීමටයි. ට්‍රොල් අධෛර්ය කිරීමට හොඳම ක්‍රමය වන්නේ ඒවා නොතකා හැරීමයි. එහෙත්, එය හැමවිට ම සාර්ථක වන්නේ නැත. ගත හැකි වෙනත් පියවර මොනවා ද?
- අන්තර්ජාලයේ නිර්නාමිකත්වය ව්‍යාජ අනන්‍යතා භාවිතා කරමින් සයිබර් හිංසනයේ යෙදෙන පුද්ගලයන් විසින් අපහරණය කරනු ලැබේ. සෑම අයෙකු ම තම සැබෑ අනන්‍යතාව යටතේ අන්තර්ජාල සේවා භාවිතා කරන්නට පෙළඹේ ද? එවැනි තත්වයක් අවදානමට මුහුණ දෙන කණ්ඩායම්වලට කෙසේ බලපානු ඇද්ද?

- මෑත පර්යේෂණවලින් හෙළිදරව් වූ පරිදි ශ්‍රී ලංකාවේ භාෂා තුනේ ම ෆේස්බුක් පිටුවල පුරුෂාධිපත්‍යවාදී හා ලිංගවාදී සංස්කෘතිය පොදු ලක්ෂණයකි. මෙය බාහිර සමාජයේ ලක්ෂණවල ම ප්‍රකාශනයක් ද? ෆේස්බුක් යනු අපේ සමාජයේ කැඩපතක් ද?

- ඔබ කිසියම් දිනෙක ෆේස්බුක් හි ප්‍රශ්නකාරී අන්තර්ගතයක් පිළිබඳ වාර්තා කර තිබේ ද? එසේ නම්, ඔබේ අත්දැකීම කුමක් ද?

- සමාජ මාධ්‍ය වේදිකාවන්ගේ ප්‍රජා ප්‍රමිතීන් ගැන ඔබ සිතන්නේ කුමක් ද? ඒවා ප්‍රමාණවත් ද? වේදිකාවන් විසින් නිසි අධීක්ෂණයක් කරනවා ද? තවදුරටත් කළ හැක්කේ මොනවා ද?

- අන්තර්ජාලයේ තමන්ට එරෙහිව කරන ලද අපරාධවලට එරෙහිව යුක්තිය සෙවීම වින්දිතයන්ට මෙතරම් දුෂ්කර ඇයි? නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ට සහ යුක්ති ක්‍රියාවලියට මීට වඩා සංවේදී සහ උපකාරශීලී විය හැක්කේ කෙසේ ද?

- ශ්‍රී ලංකාව ඩිජිටල් සහ සයිබර් සුරක්ෂාව ශක්තිමත් කිරීම වෙනුවෙන් නව නීති සම්පාදනය කළ යුතු ද? එසේ නැතිනම් කළ යුතුව තිබෙන්නේ දැනට පවතින නීති ම ක්‍රියාත්මක කිරීම සහ වැඩි වන සයිබර් සූරාකෑම් මට්ටම පාලනය කිරීම සඳහා ප්‍රගාමී ලෙස ක්‍රියාමාර්ග ගැනීම වැඩි කිරීම ද? සාකච්ඡා කරන්න.

## ඉගෙනුම් ප්‍රතිඵල

මෙම මොඩියුලය අවසානයේදී ඔබ විසින් පහත දැක්වෙන කරුණු අවබෝධ කරගත යුතු ය:

- යහපත් ඩිජිටල් පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අපට විශ්වාසය, යහ චේතනා, යහපත් සම්බන්ධකම් සහ සහයෝගය වැනි ගුණධර්ම ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය ය. අපට ප්‍රගතිශීලී නීති, රෙගුලාසි සහ ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය ය.
- අන්තර්ජාල සහ ඩිජිටල් සුරක්ෂිතභාවය යනු මෙම තාක්ෂණයන් භාවිතා කරන සැමදෙනාගේ ම ගැටලුවකි. සයිබර් සූරාකෑම සහ ප්‍රචණ්ඩත්වය මෙම සුරක්ෂිතභාවයට තර්ජනයකි.
- කාන්තාවන්ට එරෙහිව තාක්ෂණය ආශ්‍රයෙන් සිදු වන ප්‍රචණ්ඩත්වය නිවාරණය කිරීම කාන්තාවන්ට එරෙහිව පොදුවේ තිබෙන ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමේ වැදගත් කාර්යභාරයකි.කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සෑම ජීවන අවකාශයකදී ම ආරක්ෂිත හා සුරක්ෂිත වාතාවරණයක් නිර්මාණය කිරීමට එය දායක වෙයි.
- ෆේස්බුක් සහ වෙනත් සමාජ මාධ්‍ය ශ්‍රී ලංකාවේ භාවිතා කරන ආකාරය අනුව ඒවා මගින් සමාජයේ පවතින අසමානතා සහ වෙනස්කම් නිරූපණය වේ. උදාහරණයක් ලෙස පුරුෂාධිපත්‍යවාදී සහ ලිංගවාදී සංස්කෘතිය.
- සියලු ප්‍රධාන සමාජ මාධ්‍ය වේදිකාවන්ට තමන්ගේ ම නීති තිබේ. ඒවා හැඳින්වෙන්නේ ප්‍රජා ප්‍රමිති ලෙසයි. කෙසේ වෙතත්, උල්ලංඝනය කරන්නෝ නීති මගහැර යාමට ක්‍රම සොයාගනිති. වේදිකාවන් මෙන් ම පරිශීලක ප්‍රජාව වෙතින් ද ශක්තිමත් ලෙස අවදියෙන් කටයුතු කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය ය.
- සයිබර් සූරාකෑමේ සහ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන්ට නීතිමය සහන හෝ යුක්තිය වෙත පිවිසීම දුෂ්කර ය. බොහෝ වින්දිතයන් නීතිමය ක්‍රියාමාර්ග වෙත එළඹෙන්නේ නැත. එයට හේතුව අන්තර්ජාල ප්‍රචණ්ඩත්වය අධිකාරීන්ට වාර්තා කිරීමේ පද්ධතිවල තිබෙන ගැටලු ය.
- මෙම තත්වය තුළ, අවශ්‍ය උපදෙස්, මාර්ගෝපදේශ සහ සහාය සපයන්නේ විවිධ ස්වයං උපකාරක සේවා සහ සිවිල් සමාජ සංවිධානයි.

## වැඩිදුර කියවීම්

ෆේස්බුක් ප්‍රජා ප්‍රමිති
https://www.facebook.com/communitystandards/

යූටියුබ් ප්‍රතිපත්ති
https://www.youtube.com/yt/about/policies/

ට්විටර් නීති
https://help.twitter.com/en/rules-and-policies/twitter-rules

ඉන්ස්ටග්‍රෑම් ප්‍රජා මාර්ගෝපදේශ
https://help.instagram.com/477434105621119

Beyond the Report Button: Tackling Cyber-Violence in Sri Lanka.
A detailed discussion by Amalini De Sayrah, published on Bakamoono.lk
http://www.bakamoono.lk/en/article/2136/beyond-the-report-button-tackling-cyber-violence-in-sri-lanka

OPINIONS, B*TCH: Technology-based Violence Against Women in Sri Lanka
Centre for Policy Alternatives, Ghosha and Hashtag Generation, 2019
https://groundviews.org/2019/06/27/opinions-btch-technology-based-violence-against-women-in-sri-lanka/

Cyber-Exploitation and Violence: The Darker Side of Cyberspace.
Article by Radhia Rameez on Roar Media, April 2018
https://roar.media/english/life/in-the-know/cyber-exploitation-and-violence-the-darker-side-of-cyberspace/

Children's Rights and the Internet: From Guidelines to Practice. Unicef, 2016
https://www.unicef.org/csr/files/Childrens_Rights_and_the_Internet_Guidelines_to_Practice_Guardian_Sustainble_Business_English.pdf

Take Back the Tech! A call to take control of technology to end violence against women
https://www.takebackthetech.net/

Online gender-based violence: A submission from the Association for Progressive Communications to the UN Special Rapporteur on violence against women, its causes and consequences, November 2017
https://www.apc.org/sites/default/files/APCSubmission_UNSR_VAW_GBV.pdf

